**<u>රන්ජන් රාමනායක මහතා සම්බන්ධව අන්තර් පාර්ලිමේන්තු සංගමය විසින් ලබා දී ඇති තීන්දුවේ සිංහල පරිවර්තනය</u>**

අන්තර් පාර්ලිමේන්තු සංගමය
ප්‍රජාතන්ත්‍ර වාදය උදෙසා, සැම උදෙසා

ශ්‍රී ලංකාව

**අන්තර් පාර්ලිමේන්තු සංගමයේ පාලක සභාව එහි 208 වැනි සැසියේදී ඒකමතිකව ගත් තීරණය.**

මැඩ්රිඩ්,
(ස්පාඤ්ඤය) නොවැම්බර් 30 දිය .

පැමිණිලි අංකය : LKA-78 – රන්ජන් රාමනායක

**<u>පහත සඳහන් මානව හිමිකම් උල්ලංඝනය වූ බවට පැමිණිල්ල ඉදිරිපත් වී තිබේ.</u>**

- තර්ජන, බිය ගැන්වීමේ ක්‍රියා
- අමානුෂික කොන්දේසි මත රඳවා තබා ගැනීම
- සාධාරණ නඩු විභාගයක් නොමැතිකම
- අභියාචනා කිරීමට අයිතියක් නොමැති වීම
- අදහස් ප්‍රකාශ කිරීම සහ ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම
- අපයෝජනාත්මක හා අසාධාරණ ලෙස ලෙස පාර්ලිමේන්තුව අවලංගු කිරීම හෝ අත්හිටුවීම හා ඒ මගින් ඔහු ලැබූ ජනවරම අහිමි කිරීම

නිල් පැහැති කොටස පරිවර්තනය

නඩු අංකය : LKA-78
ශ්‍රී ලංකාව: අන්තර් පාර්ලිම්නේතු සංගමයට අනුබද්ධ පාර්ලිමේන්තුව
වින්දිතයා: පුරුෂ, විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී.

සුදුසුකම් ලත් පැමිණිලිකරු හෝ කාරිය:
අන්තර් පාර්ලිමේන්තු සංගම් පැමිණිලි කිරීමේ පරිපාටිය යටතේ වගන්ති
1.1 d (ඇමුණුම 1 හි පැමිණිලිකරුගේ විස්තර අමුණා ඇත.
පැමිණිල්ල ඉදිරිපත් කිරීම: අගෝස්තු 2021.

මෑත දී අන්තර් පාර්ලිමේන්තු සංගමය ගත් තීරණ
මෑත දී අන්තර් පාර්ලිමේන්තු සංගමය ගත් කමිටු විභාගයන්
මෑත දී අන්තර් පාර්ලිමේන්තු සංගමය කළ පසු විපරම්

සිද්ධිය සම්බන්ධ ශ්‍රී ලංකා බලධාරීන් සමග කළ සන්නිවේදන

නීතිපතිගේ ලිපිය 2021 නොවැම්බර්

- පැමිණිලිකරුගෙ පැමිණිල්ල 2021 අගෝස්තු

- බලධාරීන් වෙත සන්නිවේදනය, ඔක්තෝම්බර් 2021

- පැමිණිලිකරුට සන්නිවේදනය, නොවැම්බර් 2021

<u>නඩුවේ සාරාංශය</u>

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරයකු වන රන්ජන් රාමනායක මහතා ට එරෙහිව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(3) වගන්තියට අනුව අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව මත නඩුවක් පවරා තිබුණි. මේ නඩුවට පාදක වුණු පැමිණිල්ල කර තිබුණේ මාගල්කන්දේ සුදත්ත යන භික්ෂුව හා විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරියකු වන සුනිල් පෙරේරා නමැති අය විසිනි. පැමිණිල්ලට පාදක වූ කරුණ වූයේ 2017 අගෝස්තු 21 වන දින එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා අරලියගහ මන්දිරයේදී සහභාගී වූ මාධ්‍ය සාකච්ඡාවකදී කරන ලද ප්‍රකාශයකි. එම සාකච්ඡාවේදී කරන ලද ප්‍රකාශය එදිනම සිරස මාධ්‍ය ජාලයේ නිව්ස් ෆස්ට් හි ප්‍රචාරය විය.

එහිදී රන්ජන් රාමනායක මහතාගේ ප්‍රකාශයෙන් පැමිණිල්ල වෙනුවෙන් උපුටා දැක් වූයේ " ශ්‍රී ලංකාවේ විනිසුරුවන්ගෙන් හා නීතිඥයන්ගෙන් බහුතරයක් දූෂිතයන් බවත්, ඔවුන් මුදල් වෙනුවෙන් දූෂිතයන්, අපරාධකරුවන් හා මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් නිදහස් කරන බවත්" යන්නය.

මේ ප්‍රකාශය පදනම් කරගන කරන ලද පැමිණිල්ලට අනුව, ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් 2021 ජනවාරි 21 දින බරපතල වැඩ සහිත වසර හතරක සිර දඬුවමක් රන්ජන් රාමනායක මහතාට ලබා දී ඇත.

පැමිණිලි පක්ෂය සිය පැමිණිල්ල මගින් කියා සිටින පරිදි,

රාමනායක මහතාට සිරදඬුවම් නියම වී ඇත්තේ විපක්ෂ මන්ත්‍රී වරයකු ලෙස රජයට ඔහු දක්වන දැඩි විරෝධයට සහ දූෂණය, හා එයට විරුද්ධව හඬ නැගීම හා හෙළා දැකීමටත්, සහ එවැනි අනීතික ක්‍රියා මුලිනුපුටා දැමීමට ඔහු ගන්නා උත්සාහයට හා ඔහුගේ හඬට ප්‍රතිචාරයක් ලෙසය.

තවදුරටත් පැමිණිල්ල කියා සිටින්නේ ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ ඇති දූෂිත බව ප්‍රකාශ වීමට, රන්ජන් රාමනායක මහතාගේ ප්‍රකාශයට පෙරද ඕනෑ තරම් තොරතුරු තිබෙන බැවින්, ඔහුගේ ප්‍රකාශය මත අධිකරණයට අපහාස වුවා යයි සැළකීම හා ඒ මත බරපතල දඬුවමක් පැනවීම රන්ජන් රාමනායක මහතාගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනයක් බවත්,එවැනි ආකාරයකින් ඔහුගේ මන්ත්‍රී ධූරය 2021 අප්‍රේල් 07 වන දින අහෝසි කිරීම මගින් ඔහුට ජනවරම අසාධාරණ ලෙස අහිමි කිරීමක් බවත්, එසේ මන්ත්‍රී ධූරය අහිමි කිරීමෙන්, ඔහුගේ

නිදහසත්, ඔහුට ජනවරමක් දුන් ජනතාවගේ අපේක්ෂාවන්ටද බාධා ඇති වී ඇති බවත්ය.
තවද පැමිණිලි කරු හා ස්වාධීන නීතිඥයන් හා විනිසුරුවන්ගේ අදහස් විමසූ පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කරන එක්සත් ජාතීන්ගේ විශේෂ විමර්ශන කරුද කියා සිටින්නේ,
ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ අධිකරණයට අපහාස කිරීම යන කරුණ නිශ්චිතව නිර්වචනය කර නොමැති බවයි. තවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඩී) වගන්තියට අනුව සිරදඬුවම
නිමවීමෙන් පසුවද රන්ජන් රාමනායක මහතාට වසර හතක කාලයක් ප්‍රජා අයිතිය අහෝසි වීම නිසා ඡන්දය ප්‍රකාශ කිරීම හෝ මැතිවරණයට තරඟ කිරීම අහිමි වී ඇති බවයි.

තවද පැමිණිලි කරු රන්ජන් රාමනායක මහතාගේ සෞඛ්‍ය තත්ත්වය ගැනද විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටී. දියවැඩියාව, අධික රුධිර පීඩනය, කොන්දේ කැක්කුම, දණහිස් කැක්කුම වැනි ආබාධ වලින් පෙළෙන ඔහුට 2021 ඔක්තෝම්බර් මාසයේ සිට බන්ධනාගාර රෝහල් ගත වීම නිසා පමණක්, නිදාගැනීම උදෙසා ඇඳක් හිමි වූ බව පවසයි.

නැවත බන්ධනාගාරය වෙත යැවෙන විටකදී නැවතත් ඇඳක් නොමතිවන බවත්, දුරකථන පහසුකම් නොමැති බවත් මසකට වරක් එක සමීපතමයකුට විනාඩි 15 ක කාලයක් ඔහුව දැකගැනීමට අවසර ඇති බවත්, ලිපි මගින් ඔහුව සම්බන්ධ කරගත හැකි වුවත්, ඒවා ඉතා දිගු කාලයක් ප්‍රමාද වීමක් ඇති බවත් කියා සිටි.

**අන්තර් පාර්ලිමේන්තු සංගමයේ පාලක සභාව විසින් ගත් තීරණයන්.**

1. පැමිණිල්ල විභාග කිරීම සහ සහන සැලසීම සඳහා වූ ක්‍රියා පටිපාටියේ I.1.(d) වගන්තිය යටතේ සුදුසුකම් ලත් පැමිණිලිකරුවෙකු විසින් පැමිණිල්ල නිසි ආකාරයෙන් ඉදිරිපත් කර ඇති බැවින්, රන්ජන් රාමනායක මහතා සම්බන්ධව කරණු ලබන පැමිණිල්ල වලංගු මෙන්ම නිත්‍යානුකුල වේ. (ඇමුණුම 1 :පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මානව හිමිකම් පිළිබඳ කාරක සභාවේ සංශෝධිත රීති සහ භාවිතයන් සටහන් ලේඛනය )

(ii) ඒ අනුව රන්ජන් රාමනායක මහතා ගේ පහත සඳහන් අයිතීන් උල්ලංඝනය වී ඇති බවට තීරණය වේ. එනම්,

- තර්ජන, බිය ගැන්වීමේ ක්‍රියා
- අමානුෂික කොන්දේසි මත රඳවා තබා ගැනීම
- සාධාරණ නඩු විභාගයක් නොමැතිකම
- අභියාචනා කිරීමට අයිතියක් නොමැති වීම අදහස් ප්‍රකාශ කිරීමේ සහ ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම
- අපයෝජනාත්මක හා අසාධාරණ ලෙස ලෙස පාර්ලිමේන්තුව අවලංගු කිරීම හෝ අත්හිටුවීම හා ඒ මගින් ඔහු ලැබූ ජනවරම අහිමි කිරීම

2. මූලික නඩු විභාග කිරීමේ නීති සිද්ධාන්ත අනුව විභාග නොවූ, එනම් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එක අවස්ථාවකදී පමණක් විභාග කරන ලදුව, අභියාචනා කිරීමේ අවස්ථාවද නොමැතිව, නීතියේ නිශ්චිතව සටහන් නොවන ප්‍රශ්න ගත චෝදනාවක් සම්බන්ධයෙන් රන්ජන් රාමනායක මහතා දැඩි දඬුවමක් විඳිමින් සිටින බවට අනතුරු හැඟවීමට සිදුව තිබේ.

3. එම ප්‍රකාශය සිදු කරන අවස්ථාවේදී රන්ජන් රාමනායක මහතා තම භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස හා තම පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයේ මුක්තිය විඳිමින් සිටි බව පැහැදිළිය. අධිකරණයට අපහාස කිරීම සම්බන්ධ කරුණකදී සාමාන්‍ය පොදු නීති විද්‍යාවේ හා මානව හිමිකම් න්‍යායන්හි සම්මතව ස්ථාවර වී ඇති භාෂණයේ නිදහසට ප්‍රමුඛ වටිනාකම ලබා දෙන බව සම්මතයකි. ඒ අනුව රන්ජන් රාමනායක මහතාට දී ඇති බරපතල වැඩ සහිත වසර හතරක සිර දඬුවමක් සහිත තීන්දුව සම්පූර්ණයෙන්ම නුසුදුසු තීන්දුවක් බවත්, මෙහිදී අවවාද කිරීම, නැවත එවැන්නක් නොකරන ලෙසට වාරණයක් කිරීම හෝ කුඩා දඩයක් නියම කිරීමක් පමණක් සුදුසු යයි යෝජනා වේ.

4. දැඩි කනස්සල්ලට හේතුව නම් එවන් සුළු දඬුවමක් දිය යුතු කරුණකදී මේ ලබා දී ඇති දඬුවම සහ වරදකරු වීම හේතුවෙන්, රාමනායක මහතාගේ මහජන මන්ත්‍රීධුරය අහෝසි වීම හා ඡන්දයකට ඉදිරිපත් වීම මෙන්ම ඡන්ද අයිතිය භාවිතය ඒ හරහා වැළකී යාමයි.

5. එබැවින්, ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ, අන්තර් පාර්ලිමේන්තු සංගමයේ ඉල්ලීම සළකා බලා රාමනායක මහතාට නිදහස ලබා ගැනීමට හැකි වන පරිදි ජනාධිපති සමාවක් ලබා දෙන ලෙසය. එමගින් ඔහුගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය නැවත නොලැබුණ හොත් ඒ සමාව නිසා, අවම වශයෙන් ඡන්දයකට ඉදිරිපත් වීමේ අයිතිය හා ඡන්දය ප්‍රකාශ කිරීමේ

අයිතිය තහවුරු කරන ලෙසය. එමගින් අධිකරණයට අපහාස කිරීම චෝදනාව යටතේ සිදුවූ නඩු පටිපාටියේ ප්‍රතිඵලයක් ලෙස ඔහුට සිදු වූ අසාධාරණය නිවැරදි කිරීමක් සිදුවේ.

6. සාමාන්‍යයෙන් සෑම පාර්ලිමේන්තු ක්‍රමයකදීම පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව එහි සාමාජිකයින්ට අනෙකුත් රාජ්‍ය (විධායක, අධිකරණ) ශාඛා වලින් පළිගැනීම් වලින් තොරව නිදහසේ අදහස් ප්‍රකාශ කළ හැකි බව සහතික කිරීමට විශේෂ උනන්දුවක් ඇති බව තරයේ විශ්වාස කරයි. අධිකරණයට අපහාස කිරීම පැහැදිලිව නිර්වචනය කරන නීති සම්පාදනය කිරීමට ක්‍රියාකිරීම සහතික වෙමින්, චූදිතයනට අභියාචනා කිරීමට ඇති සාධාරණ අයිතිය තහවුරු කිරීමට වැඩි අවධානයක් යොමුකරන ලෙසද, මෙම කාරණය බැරෑරුම් ලෙස සැළකිල්ලට ගන්නා ලෙසද, අන්තර් පාර්ලිමේන්තු සංගමය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටියි.

7. රාමනායක මහතාගේ සෞඛ්‍ය තත්ත්වය සහ බන්ධනාගාර තත්ත්වයන් පිළිබඳව දැඩි අවධානයක් යොමුකරන ලෙසත්, ඔහු සිරගතව සිටින තාක් කල්, ඔහුට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලැබෙන බව සහතික කරන ලෙසත්, දුරකථන ඇමතුම් සහ පැමිණීම් හරහා ඔහුගේ නීතිඥයා සහ පවුලේ සාමාජිකයන් මෙන්ම, තොරතුරු ලබාගැනීමේ අයිතිය ඇති අයවලුන් සමඟ නිතිපතා සන්නිවේදනය කිරීමට ඉඩ දෙන ලෙසත් නිසි බලධාරීන්ගෙන් ඉල්ලා සිටී.

8. මෙම තීරණය ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට, පාර්ලිමේන්තු බලධාරීන්ට සහ බන්ධනාගාර බලධාරීන්ට, පැමිණිලිකරුට සහ තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇති තුන්වන පාර්ශ්වයකට දැනුම් දෙන ලෙස මහ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටී.

9. මෙම නඩුව හා තීරණ සම්බන්ධයෙන් අඛණ්ඩව අවධානය යොමුකරමින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ අන්තර් පාර්ලිමේන්තු සංගම් කමිටුවට දැනුම් දී සිටියි.

***ඉංග්‍රීසි පිටපතෙහි සිංහල පරිවර්තනය සමාප්ත යි**